"කෝටි දෙකක අයිස් සමඟ තිදෙනෙක් මීගමුවේදී දැලේ" යන සිරස්තලය සමඟින් ලංකාදීප පුවත්පතේ (මැයි 27, 2022) පළවී තිබූ පුවත් වාර්තාවකි. මෙහි පුවත් අන්තර්ගතය තුළ සඳහන්ව තිබුණේ මෙම ජාවාරම පිළිබඳව "මුස්ලිම් ජාතිකයින් දෙදෙනෙකු" සහ "ද්‍රවිඩ ජාතිකයෙකු" අත්අඩංගුවට ගෙන ඇති බවයි. එසේම, මෙම සැකකරුවන් තිදෙනාගේ නම් ද පුවත් වාර්තාව තුළ ඇතුළත්ව තිබිණි.

මේ අතර, "කෝටි තුනක අයිස් සමග තුනක් දැලේ" යන සිරස්තලය සමගින් මෙම පුවතම අරුණ පුවත්පතේ ද (මැයි 27, 2022) වාර්තා වී තිබේ. එහි සමස්ත පුවත පුරාම අදාළ පුද්ගලයින්ව "සැකකරුවන්" ලෙසින් හැඳින්වෙන අතර, සැකකරුවන් තිදෙනාගේ නම් පුවත් වාර්තාවේ සඳහන් කොට නොතිබුණි.

මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන් ඔස්සේ දැක්වෙන ලෙසට, යම් පුද්ගලයෙකුගේ වාර්ගිකත්වය හෝ ආගම වැනි තොරතුරු දැක්විය යුත්තේ එම පුවතට සෘජුවම අදාළ වන්නේ නම් පමණි.

එසේ නම්,

1) එකම පුවතක් වාර්තා කරන අරුණ පුවතේ කිසිදු වාර්ගිකත්වයක් සඳහන් නොවන්නේ නම්, ලංකාදීප පුවතේ "මුස්ලිම්" සහ "ද්‍රවිඩ" යනුවෙන් වාර්ගිකත්වය ඉස්මතු කොට දැක්වීම පුවතට අදාළ නොවේ යැයි ඔබ නොසිතන්නේ ද?

2) මෙසේ වාර්ගිකත්වයක් සෘණාත්මක ලෙසින් ඉස්මතු කොට දැක්වීම සඳහා යම් කිසි පදනමක් තිබේ යැයි ඔබ සිතන්නේ ද? එසේ නැති නම්, එය යම් වාර්ගිකත්වයන් සෘණාත්මක ලෙස ඒකාකෘතික කොට දැක්වීමක් නොවන්නේ ද?

ඔබේ අදහස?